ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1998 අංක 23 දරන රාජපක්ෂ අනුස්මරණ අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 මැයි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 මැයි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

## 1998 අංක 23 දරන රාජපක්ෂ අනුස්මරණ අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1998 මැයි මස 19 වැනි දින]

එල්. ඩී.–ඕ. 17/93.

**රාජපක්ෂ අනුස්මරණ අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"රාජපක්ෂ අනුස්මරණ, අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජ සේවා පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව එහි පරමාර්ථ සහ ඊට සම්බන්ධ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදීමේ කාර්යය සඳහා, මෙතෙක් කල් ශ්‍රී ලංකාවෙහි පිහිටුවා තිබූ හෙයින් ද ;

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටුකර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මෙම පනත 1998 අංක 23 දරන රාජපක්ෂ අනුස්මරණ, අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

රාජපක්ෂ අනුස්මරණ අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජ සේවා පදනම සංස්ථාගත කිරීම.

**2.** මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන රාජපක්ෂ අනුස්මරණ, අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජ සේවා පදනමෙහි දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භවන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "රාජපක්ෂ අනුස්මරණ, අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජ සේවා පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තවද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබාගැනීමේ හා පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මාර්ග සංවර්ධන හා නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ද ආරෝග්‍ය ශාලා, කලායතන,ගුවන් විදුලි සහ රූපවාහිනී වැනි ජන සංනිවේදන මාධ්‍ය ආයතන සහ අධ්‍යාපන මධ්‍යස්ථාන, පාසල්, ප්‍රජා මධ්‍යස්ථාන ඉදිකිරීම හා දියුණු කිරීම ද නගර හා ග්‍රාම සංවර්ධනය සඳහා ආධාර විය හැකි වෙනත් එවැනි වැඩ සහ ක්‍රියාකාරකම් බාර ගැනීම :

(ආ) දිළිඳු දරුවන්ට යම් වෘත්තියක්, රක්ෂාවක් හෝ සේවයක් සඳහා සූදානම් වීමේ, ඇතුළත් වීමේ හෝ නිරතවීමේ අවස්ථා සැලසීම සහ ඔවුන්ට ඇඳුම් පැළඳුම්, අධ්‍යාපනික වියදම් හෝ වෙනත් පහසුකම් සැලසීම ;

(ඇ) සිසුර අධ්‍යාපන ශිෂ්‍යත්වය පවත්වාගෙන යාම, අධ්‍යාපනය සහ දැනීම ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා ශිෂ්‍යාධාර, ශිෂ්‍යත්ව, ත්‍යාග, පරිත්‍යාග, මුල්‍යාධාර සහ වෙනත් ආධාර ප්‍රදානය කිරීම, සැපයීම සහ සැලසීම සහ පුස්තකාල සහ සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීම :

(ඈ) බෞද්ධ දර්ශනය සහ බෞද්ධ ජීවන මාර්ගය ආරක්ෂා කිරීම හා ප්‍රචාරය සඳහා ආධාර කිරීම :

(ඉ) ශ්‍රී ලංකාවේ හා පිටරටවල වෙනත් බෞද්ධ සංවිධාන සමග මිත්‍ර සම්බන්ධතා ඇතිකර ගැනීම :

(ඊ) ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් සඳහා වෘත්තීය අධ්‍යාපන පාඨමාලා පැවැත්වීම :

(උ) ශිෂ්‍යයන්ට කුඩා කර්මාන්තවල පුහුණුව ලබාදීම සහ ප්‍රයෝජනවත් පුරවැසියන් වශයෙන් ස්ථාපනය වීම පිණිස ඔවුන්ට මුදලින් හෝ අන්‍යාකාරයෙන් උපකාර වීම :

(ඌ) පිරිවෙන් පාසල් සහ වෙනත් අධ්‍යාපන ආයතන පිහිටුවීමෙන් සහ පවත්වාගෙන යාමෙන් සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමෙන් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම :

(එ) දුප්පත්, අනාථ සහ රෝගී තැනැත්තන්ට වෛද්‍ය සහන, ආහාර සහ නිවාස සැපයීම :

(ඒ) අනාථ නිවාස සහ මහළු නිවාස පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ සමාජ සුභසාධන මධ්‍යස්ථාන පිහිටුවීම :

(ඔ) අඳ, ගොළු, බිහිරි සහ ආබාධිත තැනැත්තන් සඳහා සුභ සාධන පහසුකම් සැලසීම සහ නිවර්තන නිවාස පිහිටුවීම :

(ඕ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමෙහි ලා නිරතවන ස්වේච්ඡා සේවකයන්ට සහ වෙනත් තැනැත්තන්ට ශිෂ්‍යත්ව මගින් හෝ අන්‍යාකාරයකින් ආධාර දීම :

(ක) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම, පොත්පත්, සඟරා, සමරු කලාප සහ වාර සඟරා ආදියට දායකවීම සහ ඒවා නිකුත් කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යෝග්‍ය වෙතැයි සලකනු ලබන වෙනත් සේවා සැලසීම :

(ක) රාජපක්ෂ අනුස්මරණ නිවාඩු නිකේතනයක් සහ උද්භිද උද්‍යානයක් ඇති කිරීම සහ පවත්වාගෙන යාම :

(ච) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමෙහි ලා ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, දාර්ශනික සාකච්ඡා, වැඩමුළු, පන්ති, විවාද, සම්මේලන, චාරිකා, විනෝද ගමන් හෝ වෙනත් කටයුතු ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම, සංවිධානය කිරීම හා පැවැත්වීම :

(ජ) සංස්ථාවේ පරමාර්ථ වලට සමාන පරමාර්ථ ඇති වෙනත් සමිති, සංගම් හෝ සංවිධාන සමග සහයෝගීවීම සහ සහචර්යවීම :

(ට) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් ස්ථානයක දී සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යයන සහ දේශන සඳහා අනුග්‍රහය දැක්වීම සහ ඒවා පවත්වාගෙන යාම :

(ඩ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය යයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම: සහ

(ණ) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය, ආනුෂංගික හෝ හිතකර වෙනත් යම් ක්‍රියා සහ දේ ඉටු කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

4. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන පාලකවරුන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවක් වෙත, මේ පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමේ පාලක සභාවේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ ද මෙහි උපලේඛනයේ නම් සඳහන් කොට ඇත්තා වූ ද සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම සභාවේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සාමාජික නාමලේඛනය.

5. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පදනමෙහි සාමාජිකයකු වූ සෑම තැනැත්තකුගේ ම සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කර ගනු ලබන සෑම තැනැත්තකුගේ ම නම ඇතුළත් කළ යුතු සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යාමට පාලක සභාව විසින් සැලැස්විය යුතු ය.

සංස්ථාවේ බලතල.

6. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව–

(අ) සංස්ථාවේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට;

(ආ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට, තිකුත් කිරීමට සහ බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට සහ වැසීමට;

(ඇ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඈ) දායක මුදල්, සම්මාදම්, ප්‍රදානයන්, පරිත්‍යාග සහ සියලු වර්ගවලට අයත් ත්‍යාග, ඉල්ලා සිටීමට සහ භාර ගැනීමට;

(ඉ) යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්තුවලට එළඹීමට:

(ඊ) යම් නිශ්චල දේපළකට හෝ පෞද්ගලික දේපළකට බලපාන කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට:

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට සහ සංස්ථාව විසින් තීරණය කරනු ලබන යම් වැටුප් දීමනා සහ පාරිතෝෂික ඔවුන්ට ගෙවීමට:

(ඌ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී සේවක පිරිස් පුහුණු කිරීමට ; සහ

(එ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල වෙනත් සියලු දේ කිරීමට

සංස්ථාවට බලය ඇත්තේ ය.

**7.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පංතියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් නෙරපීම හෝ ඔවුනගේ ඉල්ලා අස්වීම:

(ආ) සභාව තෝරා පත් කර ගැනීම, සභාවේ නිලධරයන් ඉල්ලා අස්වීම, ධුර අත් හැරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ සභාවේ බලතල කාර්ය සහ ක්‍රියා කලාපය:

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුන් සේවයෙන් පහකිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය, කර්තව්‍ය සහ චර්යාව:

(ඇ) සභාවේ, සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම කැඳවීම සහ පැවැත්වීම, පුරප්පාඩු පිරවීම, රැස්වීම පිළිබඳ දැන්වීම සහ න්‍යාය පත්‍රවල, ගණපූරණය සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම:

(ඉ) සභාවේ සහ සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්:

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති පදනමේ රීති, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු අතර, එම රීති මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් මෙතෙක් කල් ලැබී තිබුණු හෝ මින් මතු ලැබෙන සියලු මුදල් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් එකී අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**9.** (1) සංස්ථාවේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ අනෙකුත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් තැබීමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාවේ ගිණුම් යටත් පිරිසෙයින් වර්ෂයකට වරක් පරීක්ෂා කර විගණනය කරනු ලැබිය යුතු ය.

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනමෙහි පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට පදනමට ගෙවිය යුතු සියලු ණය, සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. පදනම විසින් සහ පදනම ට ගෙවිය යුතු ණය.

**11.** මිලට ගැනීමේ, ප්‍රදානය කිරීමේ, ත්‍යාග කිරීමේ හෝ බදු දීමේ යම් සාධන පත්‍රයක් මත හෝ එවැන්නක් ප්‍රකාර හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මත හෝ එවැන්නක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ ලැබෙන චංචල හෝ නිශ්චල සියලු දේපළ, අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, එවැනි සියලු දේපළ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට සහ භාරවලට ද යටත්ව අදාළ සාධන පත්‍රවල හෝ දේපළ බැහැර කිරීමේ අන්තිම කැමති පත්‍රයේ විධිවිධානවලට හා කොන්දේසිවලට ද යටත්ව භාරවලට අදාළ යම් ලිඛිත නීතියක විධිවිධානවලට සහ අදාළ සාධන පත්‍රයේ හෝ දේපළ බැහැර කිරීමේ අන්තිම කැමති පත්‍රයේ විධිවිධානවලට යටත්ව විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ, බැඳ තැබීමේ හෝ යටත් කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**12.** සභාවේ සාමාජිකයකු, ලේකම්වරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුවද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තවද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**13.** සංස්ථාවේ කිසිම සාමාජිකයෙක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු ග්‍රාහක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් සාමාජික මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය. සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායම හෝ දේපළ ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කර ඇත්තා වූ ද වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් සහ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය [4(2) වන වගන්තිය]

චමල් රාජපක්ෂ මහතා (සභාපති)
මහින්ද රාජපක්ෂ මහතා (උප සභාපති)
බැසිල් රාජපක්ෂ මහතා
ගෝඨාභය රාජපක්ෂ මහතා
ඩඩ්ලි රාජපක්ෂ මහතා
ප්‍රීති රාජපක්ෂ මහත්මිය
විචිත්‍රා රාජපක්ෂ මහත්මිය
ලලිත් චන්ද්‍රදාස මහතා (භාණ්ඩාගාරික)
තුසිත් රණවක මහතා
ඩිව් ගුණසේකර මහතා
ධූ. විජේසිංහ මහතා (ලේකම්)
චන්ද්‍රා විජේවර්ධන මහත්මිය
ශිරන්ති වික්‍රමසිංහ මහත්මිය
රම්‍යා හෙට්ටිආරච්චි මහත්මිය
අයෝමා පීරිස් මහත්මිය
පුෂ්පා වික්‍රමසිංහ මහත්මිය

## 1998 අංක 23 දරන රාජපක්ෂ අනුස්මරණ අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත

යතීන්ද්‍ර පෙරේරා මහත්මිය
ශමීන්ද්‍ර කුමාර රාජපක්ෂ මහතා
ශමින්ද්‍ර පුන්සිරි රාජපක්ෂ මහතා
හිමාල් හෙට්ටිආරච්චි මහතා
රංගනී හෙට්ටිආරච්චි මෙනවිය
තේජනී රාජපක්ෂ මෙනවිය
චමින්ද රාජපක්ෂ මහතා
හෙන්රි දිසානායක මහතා
වර්නන් සමරකෝන් මහතා
නිහාල් ගුණසේකර මහතා
එන්. රත්නායක මහතා
සරත් අමරවීර මහතා
ඒ. වීරරත්න මහතා
ජේ. පී. රත්නායක මහතා
ජේ. අමරවික්‍රම මහතා
උපුල් දිසානායක මහතා
විශ්ව දිසානායක මහතා
උදයංග වීරතුංග මහතා
දුලාරි දිසානායක මෙනවිය
කිත්සිරි සේපාල මහතා
කීර්ති දිසානායක මහතා
දුෂ්‍යන්ත රූපසිංහ මහතා
සංජීව රූපසිංහ මහතා
ජාලිය වික්‍රමසිංහ මහතා
අරුණ ගුණරත්න මහතා
එස්. ජයසුන්දර මහතා
කේ. එම්. ඒ. ගොඩවත්ත මහතා
ජී. එච්. පී. ප්‍රේමසිරි මහතා
මැන්දිස් රෝහණධීර මහතා
වී. ජයසිංහ මහතා
ලයනල් සරත් එදිරිසිංහ මහතා
ඩී. සී. එච්. සමරසිංහ මහතා

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.